www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එල්ටීටීඊයේ විරුද්ධවාදී කන්ඩායම සමග ශ්‍රී ලංකා මිලිටරියේ යටිකූට්ටු ක්‍රියා සටන් විරාමය තර්ජනයට ලක්කරයි

## Sri Lankan military's intrigues with LTTE rebel faction threatens ceasefire

**කේ. රත්නායක විසිනි**
**2004 ජුලි 08**

කරුනා යන නමින් වඩා ප්‍රසිද්ධ, එල්ටීටීඊයේ හිටපු නැගෙනහිර අන දෙන නිලධාරි වී. මුරලිදරන්ගේ නායකත්වයෙන් යුත්, එම සංවිධානයෙන් බිඳී ගිය කන්ඩායමට, හමුදාව විසින් සහාය දී ඇති බවට තොරතුරු එලිදරව් වීමෙන් අනතුරුව, ශ්‍රී ලංකාවේ සටන් විරාම ගිවිසුම වඩවඩාත් තර්ජනයට ලක්ව තිබේ. කන්ඩායම් දෙක අතර නැගෙනහිර පලාතේ පවත්නා ගැටුම් අඛන්ඩව සිදු වන තතු තුල, කරුනා සමග මිලිටරිය ගෙන යන කුමන්ත්‍රනකාරී සබඳතා දිගටම පැවතුන හොත්, යලි යුද්ධයක් ඇවිලිය හැකි යයි, එල්ටීටීඊය අනතුරු අඟවා ඇත.

සංවිධානයේ ඉහල තනතුරු හා සටන් විරාමයෙන් ලද වාසි ඒකාධිකාරී ලෙස භුක්ති විඳින බවට උතුරේ වන්නි නායකත්වයට චෝදනා කරමින්, කරුනා කන්ඩායම පසුගිය මාර්තුවේ දී එල්ටීටීඊයෙන් භේද විය. අප්‍රේල් මස මැද මඩකලපු-අම්පාර ප්‍රදේශවල පාලනය ඉක්මනින් ම යලි සියතට ගැනීමට එල්ටීටීඊය සමත් වුවත්, සැක කටයුතු හා අපැහැදිලි වාතාවරනයක් තුල, ප්‍රදේශයේ ඝාතන මාලාවක් ම සිදු වී ඇත.

අප්‍රේල් අග සිට මේ දක්වා, කරුනාට හිතවත් සාමාජිකයන් හත් දෙනකු ඇතුලුව, එල්ටීටීඊ සාමාජිකයන් අඩු ගනනේ 21ක් ඝාතනයට ලක්ව තිබේ. ඊට අමතරව, ආන්ඩුවේ පාලනය යටතේ පවත්නා ප්‍රදේශවල සිවිල් වැසියන් 6 දෙනෙක් ද එමෙන් ම පොලිස් හා හමුදා ඔත්තු සේවා නිලධාරීන් හා ඔවුන්ට තොරතුරු සපයන පුද්ගලයන් ගනනාවක් ද වෙඩි තබා ඝාතනය කෙරී ඇත. හමුදා ඔත්තු අංශය ඇතුලු, ශ්‍රී ලංකා හමුදාවේ සහයෝගය ඇතිව කරුනාගේ සටන්කරුවන් තම කේඩර්වරු ඝාතනය කර ඇතැයි වන්නි නායකත්වය චෝදනා කරයි. මිලිටරිය හා ආරක්ෂක අමාත්‍යාංශය මෙම චෝදනා නැවත නැවතත් ප්‍රතික්ෂේප කර තිබේ.

එනමුදු, ජූනි 21 දා, නැගෙනහිර එල්ටීටීඊ කාන්තා මිලිටරි අංශයේ හිටපු ප්‍රධානී, කරුනාට පක්ෂපාතී, නිලාවිනි, වන්නියේ කිලිනොච්චි නගරයේ පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවක පෙනී සිටියා ය. විපාර්ශ්වික එක්සත් ජාතික පෙරමුනේ (එජාපෙ) පාර්ලිමේන්තු මන්ත්‍රී අලි සහිර් මවුලානා සයිඩ් විසින් තමා, කරුනා සහ කාන්තා මිලිටරි අංශයේ තවත් ඉහල පෙලේ සාමාජිකයන් තිදෙනෙක් කොලඹට ගෙන එනු ලැබූ බව, නිලාවිනි පැහැදිලි කලා ය.

මුලින් ම නගරයේ පිහිටි තරු පහේ හෝටලයක් වන ජයික් හිල්ටන්හි නතර කොට සිටීමෙන් පසුව, ඔවුහු ආරක්ෂක නිවාසවලට මාරු කරන ලදි. නිලාවිනිට අනුව, හමුදා ඔත්තු අංශයේ ඉහල පෙලේ නිලධාරීන්, නිතිපතා කරුනා මුනගැසීමට එහි පැමින ඇත. තමන් රට හැර යන බව, ජූනි 13 දා කරුනා කාන්තාවන්ට පැවසූ විට, ඔවුහු තම ඥාතියකු සමග සබඳතා ඇති කරගෙන, වන්නියට පැමින යලි එල්ටීටීඊයට එක් වූහ.

කතන්දරයේ තොරතුරු පැහැදිලි නැත. එහෙත් ඉන් පසුව, අලි මවුලානා, තමන් එම කන්ඩායම කොලඹට ගෙන ආ බව පිලිගෙන, අනතුරුව ඇති වූ විරෝධය මධ්‍යයේ සිය මන්ත්‍රී තනතුරෙන් ඉල්ලා අස්වී ඇත. මිලිටරියේ ප්‍රතික්ෂේප කිරීම් තිබිය දී ම, හමුදාව, කරුනා සහ එම කාන්තාවන් "ආරක්ෂක අත් අඩංගුවේ" තබා ගෙන සිටි බවට සාක්ෂි ගලා එමින් තිබේ.

නිලාවිනිගේ ප්‍රවෘත්ති සාකච්ඡාවෙන් අනතුරුව, ආරක්ෂක ලේකම් සිරිල් හේරත්, බීබීසී සිංහල සේවාවට කතා කරමින්, "චෝදනා තරයේ ප්‍රතික්ෂේප කලේ ය". එහෙත් එක්සත් ජනතා නිදහස් සන්ධාන (එජනිස) ආන්ඩුවේ ඇමතිවරයකු විසින් කල ප්‍රකාශ ඔහුගේ අදහස්වලට පරස්පර විරෝධී විය. මිලිටරියේ කොටසක් කරුනා කන්ඩායමට සහාය දී ඇතැයි ද ඒ ආන්ඩුවේ දැනුවත්කමකින් හෝ අනුමැතියකින් තොරව යයි ද, ජූනි 24 දා පැවති කැබිනට් ප්‍රවෘත්ති සාකච්ඡාවක දී, මාධ්‍ය ඇමති මංගල සමරවීර පිලිගත්තේ ය.

බීබීසී වාර්තාවකට අනුව, සමරවීර මෙසේ ප්‍රකාශ කලේ ය: "පැහැදිලිවම මිලිටරි නිලධාරින් මෙයට සම්බන්ධ වී තිබෙනවා. මා අදහස් කරන පරිදි, අපට එය ප්‍රතික්ෂේප කරන්න බැහැ. ඒත්, ඒ ආන්ඩුවේ අනුදැනුමක් හෝ අවසරයක් ඇතිව නො වේ." ආන්ඩුව සිද්ධිය පිලිබඳව පරීක්ෂන පවත්වන බව පැහැදිලි කල ඔහු, කරුනාට උදව් කිරීම හා සාම ක්‍රියාදාමය

කඩාකප්පල් කිරීමට ප්‍රයත්න දැරීම මගින් විරුද්ධ පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහගේ "දෙපිටකාට්ටුකම" ප්‍රදර්ශනය වන බවට චෝදනා කරමින්, අවධානය වෙනතකට යොමු කිරීමට උත්සාහ කලේ ය. සිද්ධියට තමන්ගේ කිසිදු සම්බන්ධතාවක් නැතැයි වික්‍රමසිංහ පවසා තිබේ.

සමරවීර මාධ්‍ය වාර්තා "නිවැරදි කරමින්" එදිනම තවත් ප්‍රකාශයක් නිකුත් කලේ ය. ඒවායේ "කියන පරිදි, කරුනා සිද්ධියට ශ්‍රී ලංකා මිලිටරියේ අනුමැතියක් ඇතැයි තමන් නො පිලිගත්" බව ඔහු අවධාරනය කරයි. එහෙත් මිලිටරියේ කොටස් එයට සම්බන්ධ ය යන කරුන ඔහු ප්‍රතික්ෂේප කර නැත. නියෝජ්‍ය ආරක්ෂක ඇමති රත්නසිරි වික්‍රමනායක, "කරුනාට පලා යාමට හෝ ඉන් පසුව හෝ කිසිදු ආකාර උදව් කිරීමකට, හමුදාව, කොහෙත්ම සම්බන්ධ නැතැ"යි ප්‍රකාශ කරමින්, සිද්ධිය මුලුමනින් ම යට ගැසීමට උත්සාහ දැරී ය. "ආන්ඩුවට එරෙහි කොටස්" ගෙන යන "බොරු ප්‍රචාරවලට" ඔහු දෝෂාරෝපනය කලේ ය.

මිලිටරි සංස්ථාපිතය සමග සමීප සබඳතා පවතින, *සන්ඩේ ටයිම්ස්* ආරක්ෂක ලියුම්කරු ඉක්බාල් අතාස්, ජුනි 27 දා සිය සුපුරුදු ලිපියේ මෙසේ සඳහන් කලේ ය: "හමුදාව 'කර්නල්' කරුනා හා ඔහුගේ පාර්ශ්වය" "ආරක්ෂක අත් අඩංගුවේ" තබා ගෙන සිටි බව එලිදරව් කර ගැනීමට *සන්ඩේ ටයිම්ස්* සමත්ව ඇත. එවන් ආරක්ෂාවක් ඔහුට සපයන ලද බවත් උත්සුක බලධාරින්ගේ අවධානය පිනිස කේඩර ගෙන ආ බවත්, *සන්ඩේ ටයිම්ස්* විසින් කරන ලද පරීක්ෂන මගින් එලිදරව් කෙරුනි. ඔවුහු ඒ ගැන මුලුමනින් ම දැන සිටියහ."

තමන් මේ ගැන කිසිත් නො දන්නා බවට ආන්ඩුව හා මිලිටරිය විසින් කරනු ලබන ඒකාන්ත ප්‍රකාශ, තව දුරටත් එලිදරව් කෙරෙන තොරතුරු එලිමහනට පැමින ඇත. ඊලම් ජනතා ප්‍රජාතන්ත්‍ර පක්ෂයේ (ඊපීඩීපී) නායක කැබිනට් ඇමතිවරයකු වන ඩග්ලස් දේවානන්ද, කරුනා සමග සබඳතා පවත්වමින් සිටී. තමන් එල්ටීටීඊයට ද්‍රෝහී වූ මෙම නායකයා සමග කතා කලා පමනක් නො ව, දේශපාලන පක්ෂයක් තනන ආකාරය පිලිබඳව ඔහුට උපදෙස් දුන් බව ද දේවානන්ද පිලිගෙන ඇත. ඊපීඩීපී යනු උතුරේ දී එල්ටීටීඊයට එරෙහිව හමුදාව සමග සමීප සහයෝගිතාවකින් කටයුතු කිරීම සම්බන්ධයෙන් කුප්‍රකට, දෙමල පක්ෂයක් හා සන්නද්ධ කන්ඩායමකි.

**භයානක සෙල්ලමක්**

කරුනා සමග මිලිටරිය ගෙන යන ගනුදෙනුවල නියම ස්වරූපය අපැහැදිලි නමුත්, සිදු වන දේ පිලිබඳව ඉහල මිලිටරි නායකයන් කිසිවක් නො දනී යන්න පිලිගත හැකි කරුනක් නො වේ. අඩුම ලංසුවෙන් ගත හොත්, කරුනාගේ සටන්කරුවන් එල්ටීටීඊයේ වන්නි නායකත්වයේ කේඩරවලට හා ආධාරකරුවන්ට එරෙහි ප්‍රහාර ගෙන යන තතු තුල, මිලිටරිය හෝ එහි කොටස්, කරුනා "ආරක්ෂක අත් අඩංගුවේ" රඳවා ගෙන සිට ඇත.

මිලිටරියේ ක්‍රියාකලාපයේ පැහැදිලි බලපෑම නම්, වත්මන් සටන් විරාමයට ද එල්ටීටීඊය සමග සාකච්ඡා යලි ඇරඹීමට ආන්ඩුව දරන ප්‍රයත්නයන්ට ද වලකැපීම ය. දෙමල ජනතාවගේ "එකම නියෝජිතයා" බවට තමන් කරන කියාපෑම්වලට අභියෝග කරන හා සිය සටන්කරුවන් ඝාතනය කිරීමේ යෙදී සිටින, කැරලිකාර කන්ඩායමක් සමග හමුදාව කුමන්ත්‍රනකාරී සබඳතා පවත්වා ගෙන යන තත්වයක් දිගටම ඉවසා සිටීම එල්ටීටීඊ නායකත්වයට පැහැදිලිව ම කල නො හැකි දෙයකි.

නෝර්වේජියානු විශේෂ නියෝජිත එරික් සොල්හෙයිම්, පැහැදිලිව ම, "කරුනා සිද්ධිය" මගින් ශ්‍රී ලංකාව යලි යුද්ධය කරා ඇද හෙලනු ලැබීමේ හැකියාව සම්බන්ධයෙන් උත්සුකව, පසුගිය සතියේ දින හතරක සංචාරයක් සඳහා යලි දිවයිනට පැමිනියේ ය. ඇගේ එජනිස අප්‍රේල් 2 දා මහ මැතිවරනයෙන් එජාපෙ පරාජය කිරීමෙන් පසුව, ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග, අප්‍රේල් අග දී, ඊනියා සාම ක්‍රියාදාමයේ මැදහත්කරු ලෙස සිය ක්‍රියාකලාපය යලි අරඹන ලෙස නෝර්වේ ආන්ඩුවෙන් ඉල්ලා සිටියා ය.

සොල්හෙයිම්, ජුනි 30 දා එල්ටීටීඊය දේශපාලන අංශයේ නායක එස්.පී. තමිල්චෙල්වම් හමුවූ නමුත්. නව සාම සාකච්ඡා සඳහා ඉඩක් විවර කරගැනීමට හැකි වූයේ නැතැයි, ඔහු ප්‍රකාශ කලේ ය. මාධ්‍යවලට කල සිය ප්‍රකාශයේ දී, එයට හේතුව කෙලින් ම පැහැදිලි කරමින් තමිල්චෙල්වම් මෙසේ පැවසී ය: "ශ්‍රී ලංකාවේ ජනාධිපතිනිය හා ආන්ඩුව සටන් විරාමය හා සාම සාකච්ඡා සම්බන්ධයෙන් බැරෑරුම් සහගත නම්, ඔවුන් කරුනාට රැකවරනය සැපයීමත් ඔහුගේ හෙන්චයියන්ගෙන් සමහරකුගේ අනුග්‍රහයෙන් මඩකලපුව ප්‍රදේශයේ සිදු වූ ඝාතනවලට හා ප්‍රචන්ඩ ක්‍රියාවන්ට සහාය දීමත් නතර කල යුතු ය.... මෙම තත්වය දිගටම පවතින්නට ඉඩ දුන හොත්, එය සටන් විරාමයත් සාම ක්‍රියාදාමයත් අනතුරේ හෙලනු ඇත."

එල්ටීටීඊයේ ප්‍රතිචාරය තරමක් ප්‍රවේශම් සහගත යයි, අටුවාකරු ඉක්බාල් අතාස්, පසුගිය සති අන්තයේ *සන්ඩේ ටයිම්ස්* පත්‍රයට ලියූ ලිපියේ සටහන් කොට තිබුනි. කරුනා තම අත් අඩංගුවට භාර දිය යුතු යයි එල්ටීටීඊය ඉල්ලා නැත. "ප්‍රධාන තේමාව වූයේ, ප්‍රහාර එල්ල කිරීම පිනිස කරුනා කන්ඩායම සමග හමුදාව කුමන්ත්‍රනකාරීව සහයෝගී වී ඇතැයි යනුවෙන් එල්ටීටීඊය කරන පැමිනිල්ල යි. එල්ටීටීඊය පෙන්වා දී තිබුනේ, මෙය, හේතු කොටගෙන, මඩකලපු දිස්ත්‍රික්කයේ තම පාලනය යටතේ පවත්නා ප්‍රදේශවල සාමාන්‍ය තත්වය යලි තහවුරු කිරීමෙහි ලා තමන්ට දුෂ්කරතා නිර්මානය වී ඇති බවයි." යයි ඔහු ලිවී ය.

සොල්හෙයිම් ආන්ඩුව හා එල්ටීටීඊය අතර සංහිඳියාවක් ඇති කරලීමට උත්සාහ කරමින් සිටි අතරතුර, එක්සත් ජනපදය, සාම ක්‍රියාදාමය අනතුරේ

නො හෙලන ලෙස දෙපාර්ශ්වයට ම අනතුරු අඟවා තිබේ. එකිනෙකා සමග සාකච්ඡා කරන ලෙස එල්ටීටීඊයෙන් හා මිලිටරියෙන් ඉල්ලා සිටි එක්සත් ජනපද තානාපති ජෙෆ්රි ලන්ස්ටඩ්, "නැගෙනහිර තත්වය පාලනය කරගත නො හැකි මට්ටමකට වර්ධනය වීමට ඉඩ නො දෙන" ලෙස ඔවුනට අවවාද කලේ ය. දකුනු ආසියානු කලාපයේ සිය වැඩෙන ආර්ථික හා මූලෝපායික අවශ්‍යතාවන් අනතුරේ හෙලීමේ තර්ජනය මතු කරන, රටේ 20 අවුරුදු සිවිල් යුද්ධය අවසානයකට ගෙන එන ලෙස, වොෂිංටනය බල කරමින් සිටී.

ජුලි 1 දා සොල්හෙයිම් සමග පැවති සාකච්ඡාවලින් පසුව, ප්‍රවේශමෙන් වචන ගලපා සකස් කෙරුනු නිවේදනයක් නිකුත් කල කුමාරතුංග, "ආන්ඩුව, කරුනා කන්ඩායමට සහාය පිනිස නැගෙනහිර පලාතේ ශ්‍රී ලංකා මිලිටරියේ ක්‍රියාකාරකම් සඳහා බලය පවරා ඇතැයි යනුවෙන් එල්ටීටීඊය විසින් ප්‍රසිද්ධියේ කරන චෝදනා" ප්‍රතික්ෂේප කලා ය. මෙම ප්‍රකාශය හානිය පාලනය කරගැනීමේ එල්ලයෙන් කෙරුනු විනිවිද පෙනෙන අභ්‍යාසයකි. එය ආන්ඩුවේ මොන යම් හෝ සම්බන්ධයක් ප්‍රතික්ෂේප කල නමුදු, මිලිටරියේ කොටස් කරුනා සමග සහයෝගීව ක්‍රියා කරන්ට ඇතැයි යන කරුන එක එල්ලේ ප්‍රතික්ෂේප කොට නැත.

මේ අවස්ථාවේ දී, සිද්ධිය තුල කුමාරතුංගගේ නිශ්චිත ක්‍රියාකලාපය පැහැදිලි නැත. එහෙත්, සන්නද්ධ හමුදාවන්ගේ ප්‍රධාන අන දෙන නිලධාරිනිය හා ආරක්ෂක ඇමතිනිය ලෙස, සිදු වෙමින් පැවති දේ ගැන ඇය කිසිවක් දැන සිටියේ නැත යන්න බොහෝ සෙයින් විය නො හැක්කකි. තථ්‍ය වසයෙන් ගත් කල. පසුගිය මැයි මාසයේ දී, කුමාරතුංග, "ආරක්ෂක තත්වය වැඩි දියුනු කරනු" පිනිස, හමුදාවේ මාන්ඩලික ප්‍රධානි ලුතිනන් ජෙනරාල් එස්.එච්.එස්. කෝට්ටගොඩ, නැගෙනහිර පලාතේ සමස්ත ක්‍රියාන්විත අන දෙන නිලධාරි ලෙස, පත් කරමින්, අසාමාන්‍ය පියවරක් ගත්තා ය. කෝට්ටගොඩ, වහාම කලාපයේ මිලිටරි කඳවුරුවල සංචාරයක යෙදී, වාර්තා වී ඇති ආකාරයට, සටන් විරාම ගිවිසුමට දැඩි ලෙස කැපවන ලෙස ප්‍රදේශයේ හමුදා මූලිකයන්ට අන පැනවී ය.

ලුතිනන් ජෙනරාල් එල්.පී. බලගල්ල තනතුරෙන් විශ්‍රාම ගැනීමෙන් පසුව, පසුගිය සතියේ දී කෝට්ටගොඩ යුද හමුදාපති තනතුරට පත්වීම අර්ථභාරී ය. ජුලි 1 දා නිකුත් කෙරුනු කුමාරතුංගගේ නිවේදනය ප්‍රකාශ කලේ, "ලුතිනන් ජෙනරාල් ශාන්ත කෝට්ටගොඩගේ නායකත්වය යටතේ, ශ්‍රී ලංකා හමුදාව සටන් විරාම ගිවිසුමට දිගටම කැපවී ගන්නවා ඇත" යනුවෙනි. කොලඹ පුවත්පත් විසින් එය අර්ථදක්වන ලද්දේ, බලගල්ල වෙත හිතාමතාම එල්ල කරන ලද ඇනුම්පදයක් ලෙස ය. එම ප්‍රකාශය අත් වැරැද්දක් නො වේ. හමුදා ඔත්තු අංශයේ හිටපු ප්‍රධානියා වූ ද 1980 ගනන් අග එල්ටීටීඊයේ සන්නද්ධ ප්‍රතිවාදීන් හමුදාව සමග සහයෝගීව සටන් කරනු පිනිස බඳවා ගැනීමේ වගකීම දැරුවා වූ ද, බලගල්ල, නැගෙනහිර යටිකූට්ටු වැඩවල යෙදී සිටින බව, කුමාරතුංග පැහැදිලිව දැන සිටියා ය නැත හොත් ඒ ගැන සැක කලා ය.

ජූනි 30 දා සිය සමුගැනීමේ කතාවේ දී, බලගල්ල, එල්ටීටීඊයේ "චෝදනා" මුලුමනින් ම ප්‍රතික්ෂේප කරමින් කරුනු දැක්වී ය. එහෙත්, මාර්තු මාසයේ දී කරුනා කන්ඩායම එල්ටීටීඊයෙන් බිඳුනු විට, සංවිධානය දුර්වල කරුනු පිනිස එල්ටීටීඊයේ භේදය යොදාගැනීමට ඔහු උනන්දු විය. ඉන්දියාවේ *rediff.com* වෙබ් අඩවියට අප්‍රේල් 5 දා දුන් සම්මුඛ සාකච්ඡාවක දී ඔහු මෙසේ අදහස් දැක්වී ය: "භේදය දිගටම පැවතුන හොත්, එය ඔවුන් දුර්වල කරනු ඇත, ඒ ගැන සැකයක් නැත. කරුනා දිගටම ප්‍රභාකරන්ට විරුද්ධව කටයුතු කල හොත්, එය නිසැකව ම ඔවුනට ගැටලුවක් වනු ඇත. ඔවුහු නිසැකව ම දුර්වල බලයක් වනු ඇත."

එලිදරව් වී ඇත්තේ, හුදු කරුනා කන්ඩායම ගැන පමනක් නො ව, සාම ක්‍රියාදාමය යලි ඇරඹීමේ ආන්ඩුවේ ප්‍රයත්නයන් සම්බන්ධයෙන් ද මිලිටරිය තුල තියුනු භේදයන් පවතින බවයි. මෙම තතු නිර්මානය කිරීමෙහි ලා කුමාරතුංග ප්‍රධාන ක්‍රියාකලාපයක් ඉටු කොට ඇත.

අප්‍රේල් 2 දා මැතිවරනයට පෙරාතුව, ජනාධිපතිනිය, කලින් එජාපෙ ආන්ඩුව විසින් 2002 පෙබරවාරියේ දී අත්සන් කරන ලද සටන් විරාමයට වල කපනු පිනිස, මිලිටරිය සමගත්, විශේෂයෙන් ම බලගල්ල සමගත්, ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) වැනි සිංහල අන්තවාදී පක්ෂ සමගත්, සමීපව සහයෝගී වූවා ය. සාම සාකච්ඡා ක්‍රියාදාමය තුල දී ජාතික ආරක්ෂාව අනතුරේ හෙලමින් සම්මුති ගසා ඇතැයි ද එල්ටීටීඊයට නො දිය යුතු සහන දී ඇතැයි ද කියමින්, ඇය, හිටපු අගමැති වික්‍රමසිංහව නැවත නැවතත් විවේචනය කලා ය.

පසුගිය නොවැම්බරයේ දී ව්‍යවස්ථා කුමන්ත්‍රනයකට සමාන ප්‍රථම පියවර ගන්නා ලදි. මිලිටරියේ හා ජවිපෙ සහයෝගය සහිතව, ඇය සිය ජනාධිපති බලතල යොදා ගනිමින්, ආරක්ෂක අමාත්‍යංශය ඇතුලු මූලික අමාත්‍යංශ තුනක් පවරා ගෙන, රට පුරා හදිසි නීතිය පැනවීමට ද පියවර ගත්තා ය. ඇය අඩිය පස්සට ගත්තේ වොෂිංටනයේ හා නව දිල්ලියේ පීඩනය යටතේ ය. තුන් මසක් පැවති ආතති සහගත දේශපාලන යුද කඳවුරු බැඳීමකින් අනතුරුව, පෙබරවාරියේ දී, තේරී පත් වූ ආන්ඩුව බලයෙන් පහ කොට අප්‍රේල් 2දාට අලුත් මැතිවරනයක් කැඳවීමට කුමාරතුංග අවසානයේ පියවර ගත්තා ය.

කුමාරතුංගගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප), ජවිපෙ සහ කුඩා පක්ෂ ගනනාවක සභාගයක් වන එජනිස, එජාපෙට වඩා වැඩි ආසන සංඛ්‍යාවක් දිනාගත්

නමුදු, පාර්ලිමේන්තුවේ බහුතරයක් ලබා ගැනීමට අසමත් විය. මැතිවරනයෙන් අනතුරුව, එල්ටීටීඊය සමග සාම සාකච්ඡා යලි අරඹන ලෙස ව්‍යාපාරිකයන් හා මහ බලවතුන් වෙතින් එල්ල වූ පීඩනයට මුහුන දීමට කුමාරතුංගට ක්ෂනිකවම සිදු විය. මෙරටට ආධාර දෙන කන්ඩායම් හා රටවල් පැහැදිලි කොට කියා සිටියේ, ඩොලර් බිලියන 4.5ක මූල්‍ය ආධාර ලැබෙනු ඇත්තේ, සටන් විරාමය සහ සාම ක්‍රියාදාමය ඉදිරියට ගිය හොත් පමනක් බව ය.

කුමාරතුංග, අංශක 180ක තියුනු හැරීමක් ගෙන, නෝර්වේජියානු මැදිහත්කරුවන් කැඳවූවා ය. එහෙත් එසේ කිරීමේ දී, මිලිටරියේ හා සිංහල ස්වෝත්තමවාදී කන්ඩායම්වල සිය පැරනි සගයන් ඇගෙන් විරසක වී තිබේ. ජවිපෙ තවමත් ආන්ඩුවේ සිටින නමුත්, උතුරු හා නැගෙනහිර පලාත්වල අන්තර් වාර පාලනයක් සඳහා එල්ටීටීඊය ඉදිරිපත් කොට ඇති යෝජනා මත පදනම් වෙමින් ආන්ඩුව සාකච්ඡා ආරම්භ කල හොත්, බැරෑරුම් ප්‍රතිවිපාකවලට මුහුන දීමට සිදු වනු ඇතැයි තර්ජනය කොට තිබේ. කරුනා සමග මිලිටරිය සිදු කරන යටිකුට්ටු ක්‍රියා මගින් එලිදරව් වී ඇත්තේ, හමුදාවේ කොටසක් සටන් විරාමය කඩාකප්පල් කරනු පිනිස වැඩ කරන බවයි.

කරුනා සිද්ධිය වටා පවත්නා කුමන්ත්‍රන හා උපාමාරු මගින් යලිත් පෙන්නුම් කෙරී ඇත්තේ, මහජනතාවගේ අවශ්‍යතා හා අභිලාෂයන් ඉටු කරනු පිනිස ප්‍රගතිශීලී පදනමක රටේ විනාශකාරී සිවිල් යුද්ධය අවසන් කිරීමෙහි ලා ශ්‍රී ලංකාවේ පාලක ප්‍රභූවේ සෑම කොටසක් ම මුලුමනින් ම අපොහොසත් බවයි.

© www.wsws.org